සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සතිපාසල

විෂය - සිංහල

සතිය - තෙවන

ශ්‍රේණිය - 10

සැකසුම -එම්·ටී·පේමලතා මිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

**21 පාඩම**

මිණි ගණ සඳෙස් වැනුමින්

01.ලෝකයේ ප්‍රථම සංදේශ කාව්‍ය කුමක්ද?

එහි කතුවරයා කවුරුන්ද?

02.සිංහල සාහිත්‍යයේ ප්‍රථම සංදේශය කුමක්ද?

කතුවරයා යුගය හා කුමන රජ කෙනෙකුගේ කාලයේ රචනා වූවක්ද යන්න සඳහන් කරන්න.

03.සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගයේ රචිත සංදේශ කාව්‍ය 05ක් ලියා පහත ශීර්ෂ යටතේ කරුණු ගොනු කරන්න.

දූතයා,කර්තෘ,යුගය,අරමුණ,ගමන් මාර්ගය,පද්‍ය ගණන

පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

1) කෝට්ටේ යුගයේදී සංදේශ කාව්‍ය දෙකක් රචනා කළ කතුවරයා කවුරුන්ද?
2) “කලරැව් සඳෙස” රචකයා කවරෙකුද?
3) පාඩමේ එන පහත සඳහන් පද නිවැරදිව ගළපන්න.

| | |
|---|---|
| 1.වහළෙ’වි | 1.ඉද්ද මල් |
| 2.මලගියමල් | 2.කැඩපතෙහි |
| 3.සහස කරා | 3.බටහිර අහස |
| 4.නිසාකත | 4.රිදී |

| | |
|---|---|
| 5.සිඳු තුළ | 5.සූර්යයා |
| 6.විලිකුන් | 6.රාත්‍රිය නැමැති කාන්තාව |
| 7.නිසඹු | 7.රාත්‍රිය නැමැති අඹුව |
| 8.වුවනත | 8.මුහුණ |
| 9.කැට කෙලෙහි | 9.ඉඳුණු |
| 10.කලදෝ | 10.මුහුදෙහි |

4) පහත සඳහන් කවිය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සුනෙර මතින් අළලන සදි කිරි සයුර
ඉතර වෙරළ දිව යන මෙන් රළ පතර
පැතිර උදය ගිර සිරසින් දිලි නොහැර
මිතුර බලා යව එන සඳ රැස් වතුර

I. මෙම කවිය කාගේ නිර්මාණයක්ද?
II. ඉරි ඇඳි පදවල යෙදී ඇති අර්ථ වෙන වෙනම ලියා සඳ යන්නට මෙහි නොදුන් වෙනත් අර්ථ දෙකක් ලියන්න. .
III. මෙම කවියෙන් ඉදිරිපත් කොට ඇත්තේ කවර වර්ණයන්ද?
IV. මෙම කවියේ සඳහන් උපමාව ලියන්න.

05) 'මා දුටු සුන්දර සන්ද්‍යාවක්' මැයෙන් රචනයක් ලියන්න.